2016 - 03 - 28

Learning Resource Center
De Mazenod College
Kandana

ද මැසිනොද් විදුහල කඳාන

පළමු වාර පරීක්ෂණය 11 ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍ය - 1 කොටස කාලය පැය -1 යි

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක 1 සිට 4 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.

1 සැම දෙනාම දෝෂාරෝපණය කරන විටත් **කරබාගෙන සිටීම** ඇයගේ පුරුද්ද විය.
(1) බැණ වැදීම (2) නිශ්ශබ්දව සිටීම
(3) අහක බලාගෙන සිටීම (4) හැඬීම

2 කජු වාරයට වවුලන් ගැවසෙන **තිප්පල** වල කජු ඇට සොයා යෑම ගැමි දරුවන්ගේ විනෝද ක්‍රීඩාවකි.
(1) නිතර ගැවසෙන තැන් (2) කෑ ගසන තැන්
(3) නිදියන තැන් (4) ආහාර අනුභව කරන තැන්

3 ප්‍රධානීන්ව **දැපනෙ දාගෙන** තම තනතුරු නිලතල රැක ගැනීම ඇතැම් නිලධාරීන් ගේ කැමැත්තය.
(1) අල්ලාගෙන (2) සිරකරගෙන
(3) වසඟ කරගෙන (4) හිතවත් කරගෙන

4 දඟඩිය මහන්සියෙන් අල්ලාගත් මාළු **කුණු කොල්ලයට** විකිණීමට සිදුවීම ගැන ධීවරයෝ පසුතැවිලි වුහ.
(1) නරක් වී (2) ඉතා ලාබෙට
(3) වැඩි මිලකට (4) අසාධාරණයට

- අංක 5 සිට 8 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන් වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

5 දළදා පෙරහැර විවිධ ආගම් අතර -------------- වර්ධනය කරන චාරිත්‍රවාරිත්‍රවලින් සමන් විත වූවක් සේ අගය කළ හැකිය.
(1) සහ කම්පනය (2) සහභාගිත්වය
(3) සහජීවනය (4) සමානාත්මතාවය

6 හියුංසාං ෆාහියන් ආදීන්ගේ ------------------ වාර්තාවල මුල් යුගයේ ඇසළ පෙරහැරෙහි අසිරිය පිළිබඳව සඳහන් වේ.
(1) දේශපාලන (2) දේශමාමක
(3) දේශානුරාග (3) දේශාටන

7 ------------ යනු තොල් සඳහා යොදන පර්යාය පදයකි.
(1) ඕෂ්ඨ (2) කණ්ඨ
(3) දන්ත (4) තාලු

8 සාර්ථක කෙටිකතාවක් නිර්මාණය කිරීම--------------- කළ හැකි දෙයක් නොවේ.
(1) ආකර්ෂණයෙන් (2) සතතාභ්‍යාසයෙන්
(3) ආස්වාදයෙන් (4) ආකස්මිකව

9 අකාරාදි පිළිවෙළට වචන යෙදී ඇති වරණය තෝරන්න.
(1) අඳුර , අදහස් , අදිති , අදිසි (2) අලගු , අලක, අලාභ, අලෙවු
(3) කොච්චි , කොටු , කොටස්, කොතඹුරු (4) කසමල්, කසඹිලිය, කහවනු, කස්තාන

10 අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති වාක්‍යය තෝරන්න.

(1) මම දුරකතනයෙන් ඔහු ඇමතුවෙමි.

(2) රූපවාහිනී නාලිකාවල ප්‍රචාරය වන ඇතැම් ප්‍රාසංගික වැඩසටහන් ඉතා දුර්වල මට්ටමක පවතී.

(3) නූතන කවියෝ සිය නිර්මාණ වාච්‍යාර්ථයට වඩා ව්‍යංගාර්ථ යට මුල් තැන දී රචනා කරති.

(4) ජනකවි කතෘ අඥාත නිර්මාණ විශේෂයකි.

11 විරුද්ධාර්ථ යුගල පද දෙකක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.

(1) අඹුසැමි , හැලහොල්මන , ළඟපාත , අතමිට

(2) ඇතමැත , අගහිඟ , නිලතල , පලවැල

(3) එගොඩමෙගොඩ , නගිනබහින , ගනුදෙනු , පතපොත

(4) කොට්ටමෙට්ට , ළඳබොළඳ , අටුකොටු , විහිළුතහළු

12 මුලින් දැක්වෙන පදයට සමානාර්ථයක් නොදෙන පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) සිකුරු - ඉරබටුතරුව , සැඳෑතරුව , පහන්තරුව , ඕෂධීතරුව

(2) පොළොව - මිහිකත , මිකල් , වසුන්දරා , ධරණී

(3) ධ්වනිය - නාදය , ශබ්දය , ධ්‍යානය , රාවය

(4) මුහුණ - වත , වුවන , මුව , වක්‍ත්‍රය

13 විරුද්ධාර්ථයක් දෙන පදයක් සහිත පද පේළිය තෝරන්න

(1) දීන - නියාලු , බයාදු , යටහත් , පරාධීන

(2) කය - ගත , සිරුර , වෙර ,ඇඟ

(3) ශිෂ්‍ය - ගෝල , ජාත්‍ර , සිසු , ශිෂ්ට

(4) බහුශ්‍රැත- උගත් , වියත් , පැසුණු , අව්‍යක්ත

- 14 සහ 15 වාක්‍ය වල තද කළු අකුරින් මුද්‍රිත වාක්‍යාංශ සඳහා යෙදිය හැකි තනි පදය තෝරන්න.

14 කවිත්වය **නිරන්තරයෙන් පුරුදු පුහුණු කිරීමෙන්** සකසා ගත යුත්තකි.

(1) ප්‍රතිභාව (2) සතතාභ්‍යාසය (3) ව්‍යංග්‍යය (4) වාච්‍යාර්ථය

15 රෝගවලට **ඔරොත්තු දීමේ හැකියාව** ඇතිකර ගැනීමට නම් සමබල ආහාර ගැනීමට පුරුදු විය යුතුය.

(1) ප්‍රතිජීවනය (2) ප්‍රතිශක්තිය (3) ප්‍රතිනිර්මාණය (4) ප්‍රතිචක්‍රීයකරණය

- 16 සිට 19 තෙක් වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත කොටස් කවර ව්‍යාකරණ වර්ගයකට අයත්දැයි තෝරන්න.

16 අපි උන්වහන්සේගේ **සම්ප්‍රාප්තිය** අපේක්ෂාවෙන් නගරද්වාරයේ රැඳුනෙමු.

(1) නිපාත (2) තද්ධිත (3) උපසර්ග (4) කෘදන්ත

17 දුප්පත් ශිෂ්‍යයන් **සඳහා** විශ්ව විද්‍යාලය තෙක් අධ්‍යාපනය ලබාගැනීමට ආධාර දෙන ශිෂ්‍යත්ව ක්‍රමයක්ද ආරම්භ කෙරිණි.

(1) නිපාත (2) තද්ධිත (3) උපසර්ග (4) කෘදන්ත

18 "**අසිරිමත්** වූ දෙයකි මෙලොව ප්‍රේමය නමිනා"

(1) නිපාත (2) තද්ධිත (3) උපසර්ග (4) කෘදන්ත

19 විවිධ ප්‍රසංගය සඳහා දිවා රාත්‍රි දෙකෙහිම ඔවුහු වෙහෙස වූහ.

(1) ජාති නාම (2) සර්ව නාම (3) තද්ධිත නාම (4) ගුණ නාම

- 20 සිට 22 තෙක් ඇති ප්‍රස්තාව පිරුළු සඳහා වඩාත් ගැළපෙන අදහස ඇති වරණය තෝරන්න.

20 එක මල්ලේ ලුණු කාලා

(1) එකට ඉඳගෙන ලුණු කාලා (2) එකම බැගයෙන් ලුණු කාලා

(3) එක සමාන දුක් කරදර විඳලා (4) කිසිම රසයක් නැති දේ අනුභව කර

21 කොල්ලෑව නැති ඔරුව වගෙයි

(1) අවශ්‍යම උදව්ව නැතිවීම (2) ලොකු බලාපොරොත්තුවක් බිඳවැටීම

(3) හබල නැති ඔරුව ලෙස වීම (4) ගැලපෙන දෙදෙනෙකු යාළු වීම

22 හිඟන්නාගේ පාත්තරේට හෙනහුරා වැටුණා වගේ

(1) එක් කරදරයකට පත්ව සිටින්නෙකු තවත් කරදරයකට පත්වීම

(2) අහිංසක පුද්ගලයෙකුට වටිනා දෙයක් ලැබීම

(3) හිඟන්නා සමඟ බෙදාගෙන කෑම

(4) කරදරයකට පත්වී සිටින්නෙකුට ඉන් මිදීමට මඟක් පෑදීම

23 පහත දැක්වෙන නාම පද වල ප්‍රකෘති වෙන් කොට ලියූ කළ නිවැරදි වරණය වන්නේ,

සිංහයා , මහල්ලෝ , ග්‍රන්ථය , කන්ද

(1) සිංහ , මහල්ලා , ග්‍රන්ථයෝ , කන්දවල් (2) සිංහ , මහලු , ග්‍රන්ථ , කඳු

(3) සිංහයන් , මහල්ලන් , ග්‍රන්ථයන් , කන්දවල් (4) සිංහ , මහලු , ග්‍රන්ථවල් , කඳු

24 පහත දැක්වෙන වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අයත්වන ක්‍රියාපද වර්ග අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.

වැසි <u>වැස්සොත්</u> අස්වනු සරුවන බව <u>කී</u> තාත්තා කුඹුරෙන් ගොඩට <u>පැමිණ</u> අම්මා සමඟ කතා <u>කරමින්</u> නිවසට <u>ගියේය.</u>

(1) අසම්භාව්‍ය ක්‍රියා , පූර්ව ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , අවසාන ක්‍රියා

(2) අසම්භාව්‍ය ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , විධි ක්‍රියා , අවසාන ක්‍රියා

(3) මිශ්‍ර ක්‍රියා , ප්‍රයෝජ්‍ය ක්‍රියා , අසම්භාව්‍ය ක්‍රියා , පූර්ව ක්‍රියා

(4) පූර්ව ක්‍රියා , ප්‍රයෝජ්‍ය ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , අවසාන ක්‍රියා

25 දැඟිලි සහ මංමුළා යන වචන දෙකම නිවැරදි ලෙස විසන්ධි කර ඇති වරණය තෝරන්න.

(1) දැ + ඟිලි , මඟ + මුළා (2) දෙ + ඇඟිලි , මං + මුළා

(3) දෙ + ඇඟිලි , මං + ඟමුළා (4) දෙ + ඇඟිලි , මඟ + මුළා

26 කිරිමැටි + ආන , පිළි + උතුරු යන පද සන්ධි වන්නේ පිළිවෙළින් කිනම් සන්ධි විධි වලින්ද.

(1) ස්වර සන්ධි , ආගම සන්ධි (2) ආගම සන්ධි , පරස්වර ලෝප සන්ධි

(3) පරස්වර ලෝප සන්ධි , ස්වර සන්ධි (4) පූර්ව ස්වර ලෝප සන්ධි , ආගම සන්ධි

- 27 සිට 28 වාක්‍ය ලිඛිත ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වාක්‍ය ඇති වරණය තෝරන්න.

27 බුදුන් නාලාගිරි ඇතා දමනය කරපු අවස්ථාව එක එක ලේඛන ශෛලි වලින් එක එක කතුවරු වර්ණනා කරලා තියනවා.

(1) බුදුරදුන් නාලාගිරි ඇතු දමනය කරන ලද අවස්ථාව විවිධ ලේඛන ශෛලි වලින් විවිධ කතුවරු වර්ණනාවට ලක් කර තිබේ.

(2) බුදුරදුන් විසින් නාලාගිරි ඇතු දමනය කරන ලද අවස්ථාව විවිධ ලේඛන ශෛලී යොදාගෙන විවිධ කතුවරු විසින් වර්ණනාවට ලක් කර ඇත.
(3) බුදුරදුන් විසින් නාලාගිරි ඇතු දමනය කරන ලද අවස්ථාව විවිධ ලේඛන ශෛලී උපයෝගි කර ගනිමින් විවිධ කතුවරුන් විසින් වර්ණනාවට ලක් කර තිබේ.
(4) බුදුරදු නාලාගිරි ඇතු දමනය කරන ලද අවස්ථාව විවිධ ලේඛන ශෛලී උපයෝගි කර ගනිමින් විවිධ කතුවරු විසින් වර්ණනාවට ලක් කර තිබේ.

28 ලංකාව ආක්‍රමණිකයන්ගේ ග්‍රහණෙන් මුදවා ගන්න තමන්ගෙ ධූහඩිය පමණක් නොවේ ලේත් හෙලුපු අය බොහොමයි.
(1) ලක් දෙරන ආක්‍රමණිකයන්ගෙ ග්‍රහණයෙන් මුදවා ගැනිමට තම ඩහදිය පමණක් නොව රුධිරයද හෙළපු අය බොහෝ වෙයි.
(2) ලක් දෙරණ ආක්‍රමණිකයන්ගේ ග්‍රහණයෙන් මුදවා ගැනිමට තම ඩහදිය පමණක් නොව ලේද හලපු අය ගොඩක් වෙයි.
(3) ලක් දෙරන ආක්‍රමණිකයන්ගේ ග්‍රහණයෙන්ද මුදවා තම ඩහදිය පමණක් නොව රුධිරයහෙළුවෝ බොහෝ වෙති.
(4) ලක් දෙරන ආක්‍රමණිකයන්ගේ ග්‍රහණයෙන් මුදවා ගැනිමට තම ඩහදිය පමණක් නොව රුධිරය ද හෙළුවෝ බොහෝ වෙති.

29 රකාරාංශය , රේඵය , යංශය හා ගැටපිල්ල අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
(1) කෘත්‍රිම , වර්ගය , විද්‍යාව , ගෞරවය (2) ක්‍රමය , තර්කය , නාට්‍යය , සෘට්විය
(3) නෘත්‍ය , අග්‍ර , සත්‍යය , තෘණ (4) දෘශ්‍ය , වාක්‍ය , මාර්ග , කර්තෘ

30 පහත දැක්වෙන කවියේ උපමාව හා උපමේය පිළිවෙළින් ඇති වරණය තෝරන්න.
පෙර කල් ජාතියෙ පැතුවා වැන්නේ
පර මල් පිදුවදෝ පල දුන්නේ
නර මුල් ඇඟ ඇට කිඹුලකු වැන්නේ
නැම කල් මළ දා දෝ සැප වන්නේ

(1) කිඹුලකු , ඇඟ ඇට (2) මළ දා දෝ , හැමකල්
(3) ඇඟ ඇට , කිඹලකු (4) නරමුල් , කිඹුලකු

- අංක 31 සිට 33 තෙක් ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව වඩාත් නිවැරදි වාක්‍යය තෝරන්න.

31 (1) මාර්ටින් වික්‍රමසිංහ විශිෂ්ට ලේඛකයකු වෙයි.
(2) අපි නිතිගරුක පුරවැසියන් වෙමු.
(3) අශෝක රජතුමා දැහැමි පාලකයෙක් විය.
(4) ජෝර්ජ් කීට් විදග්ධ චිත්‍ර ශිල්පියෙකු වෙයි.

32 (1) කම්කරුවෝ පස් දෙනෙක් සතියකින් පාලම තනා නිම කළහ.
(2) මිනිස්සු අවංක නොවන්නේ ඇයි ?
(3) අපි සියල්ලන්ම ශ්‍රී ලාංකිකයෝ වෙමු.
(4) සිසුහු පන්තියට පැමිණ නැත.

33 (1) පයින් යන්නන් පාරේ දකුණු පසින් යා යුත්තාහ.
(2) මා මහණ දම් පිරිය යුත්තෙමි.

2016 . 03 . 28

(3) ඕ තුමූ ගමට ගියාය.
(4) ඕ තොමෝ මැනවින් දරුවන් ඇතිදැඩි කළාය.

- අංක 34 සහ 35 යන ප්‍රශ්නවල මුලින් ඉදිරිපත් කර ඇති පාඨ සඳහා වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

34 පරම්පරානුගතව පැවතෙන නර්තන වාදන හා රංගන අංග රාශියකින් හා ඉපැරණි චාරිත්‍ර වලින් සමන්විත ඇසළ පෙරහැර ශ්‍රී ලාංකේය අනන්‍යතාව පිළිබිඹු කරන උත්සවයක් ලෙස සැලකෙයි.
(1) පාරම්පරික නැටුම් ගැයුම් වැයුම් හා ඉපැරණි චාරිත්‍ර ඇතුළත් ඇසළ පෙරහැර ශ්‍රී ලාංකිකයන්ගේ අනන්‍යතාව ප්‍රකට කරන උත්සවයකි.
(2) ඇසළ පෙරහැර ලාංකික අනන්‍යතාව පළ කෙරෙන නැටුම් ගැයුම් වැයුම් වලින් යුක්තය
(3) පාරම්පරික නර්තන වාදන රංගන අංග ඇසළ පෙරහැරේ අනන්‍යතාව පිළිබිඹු කරයි.
(4) ශ්‍රී ලාංකික අනන්‍යතාව පළ කරන එකම උත්සවය ඇසළ පෙරහැරයි.

35 සාහිත්‍ය නිර්මාණයක ගැබ්වන හැඟීම් එහි නිර්මාපකයාගේ හෙවත් රචකයාගේ අත්දැකීම් ඇසුරෙන් උපන් ඒවා මෙන් ම රචකයා විසින් කාල්පනිකව ගොඩනඟන ලද ඒවා ද විය හැකිය.
(1) සාහිත්‍ය නිර්මාණයක ගැබ් වන්නේ රචකයා ගේ අත්දැකීම් මිස කාල්පනිකව ගොඩනඟන ඒවා නොවේ.
(2) රචකයාගේ අත්දැකීම් මෙන්ම කාල්පනිකව ගොඩනඟන හැඟීම් ද සාහිත්‍ය නිර්මාණයක ගැබ් විය හැකිය.
(3) රචකයා සිය අත්දැකීම් මෙන්ම කාල්පනිකව ගොඩනගන ලද හැඟීම්ද අනිවාර්යයෙන් සාහිත්‍ය නිර්මාණයට ඇතුළත් කරනු ලබයි.
(4) කාල්පනික හැඟීම් පමණක් සාහිත්‍ය නිර්මාණයක ඇතුළත් කිරීම නිර්මාපකයාගේ කැමැත්තයි.

36 පහත සඳහන් කවියේ තුන්වැනි පාදය දී ඇති වරණ අතුරින් තෝරන්න.

පිලේ පැදුර හේනට අරගෙන එනවා
එළා පැදුර මැස්සේ එහි සැතපෙනවා
-------------------------------------------------
හිතේ දුකට එතකොට කවි කියවෙනවා

(1) ඉර පායා ඉර අවරට යනවා (2) රටා ඇඳපු අත්දෙක මට සිහිවෙනවා
(3) රටා වියපු අත්දෙක මට සිහිවෙනවා (4) බුලත් හපා හප සුළඟට පිඹින නගේ

37 ළා තඹපත් ලියලන සඳ
දළු රත්රන් කැටයමක් ය

ප්‍රබුද්ධ කාව්‍ය සංග්‍රහයෙන් උපුටා ගත් ඉහත කවියේ රචකයා,
(1) මහින්ද ප්‍රසාද් මස්ඉඹුල (2) මහගමසේකර
(3) මඩවල එස් රත්නායක (4) එච් එම් කුඩලිගම

38 පහත සඳහන් ගද්‍ය පාඨයෙහි අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
" වහෙපුල් නැමැති අමාහැල්ලෙන් කෝ ගිනි කඳ නිවී ගිය"
(1) ඒ වාක්‍ය නැමැති අමෘත දිය දහරින් කෝවේ ගිනි ජාලාව නිවී ගියේය.
(2) ඒ වචනය නම් වූ අමෘතය නැමැති දිය දහරින් කෝපය නැමැති ගිනි ජාලාව නිවී ගියේය.
(3) ඒ අමෘතයෙන් කෝපය නිවුණේය.
(4) ඒ වචනයෙන් කෝ ගිනි නිවුණාද.

39 අප්ප උඹේ සොර දෙටුවා
අම්ම හරිම කුනකටුවා

ඒ හින්දා පුතේ උඹට
මුළු ලෝකෙම දණ නමාවි

ඉහත ගී ඛණ්ඩය ඇතුළත් වන්නේ,

(1) සිංහබාහු නාට්‍යයේ (2) කුවේණි නාට්‍යයේ
(3) නරිබැනා නාට්‍යයේ (4) හුණුවටයේ කතාව නාට්‍යයේ

40 සබරගමු පළාතේ තෙත් මුකළාන්වල වැවෙන ඕකිඩ් කුලයට අයත් අලංකාර පත්‍ර වලින් යුත් ශාකයකි.

(1) ඉරමුසු (2) ශුක්ල සාරිවා
(3) ඉරරාජ (4) කෘෂ්ණ සාරිවා

28 - 03 - 2016

(05)

Learning Resource Center
De Mazenod College
Kandana

ද මැසිනොද් විදුහල කඳාන

පළමු වාර පරීක්ෂණය 11 ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍ය - II කොටස

කාලය - පැය 2

- ප්‍රශ්න සියල්ලටම උත්තර සපයන්න.

1. (i) සිට (x) තෙක් ඇති සියලුම අනු කොටස් වලට කෙටි උත්තර ලියන්න .කිසියම් අනු කොටයකට උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i). සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් වන පහත සඳහන් අක්ෂර කාණ්ඩ දෙක නම් කරන්න.

(අ). ය ර ල ව (ආ). හ ජ ඞ ඳ ඹ

(ii). (අ) සහ (ආ) වාක්‍යවල යෙදී ඇති ' දළ ' යන වචනයට තේරුම් දෙකක් ඇත. ඒ තේරුම් දෙක පමණක් වෙන් වෙන්ව ලියන්න.

(අ). නීති විරෝධී ලෙස කපා ගත් ඇත් දළ තොගයක් විනාශ කෙරේ.

(ආ). කෙතරම් සොඳුරු වදනින් කිවද ඇයගේ දළ ගති මෑඳු නොවුණි.

(iii). පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස්ය එම වචන දෙක පමණක් නිදොස් කර වාක්‍ය නැවත ලියන්න

' අවස්ථාවෝචිත ලෙස පැරණි ඉතිහාස පොතපත කියවා ඓතිහාසික තොරතුරු රාගිභූත කර ලේඛන ගත කරන්න. '

(iv). පහත දැක්වෙන එක් එක් වචන අයත්වන සන්ධි විධිය නම් කරන්න.

(අ). පැහැති (ආ). මිහින්තල

(v). පහත දැක්වෙන කර්තෘ කාරක වාක්‍ය දෙක කර්ම කාරක වාක්‍ය බවට හරවා ලියන්න.

(අ). මම නිරතුරුවම පොත පත මිලදී ගනිමි.

(ආ). ගුරුවරු සිසුන් යහමඟ යවති.

(vi). පහත දැක්වෙන වාක්‍යයෙහි ඇතුළත් නිපාත පදයක් හා උපසර්ග පදයක් තෝරා ලියන්න.

' සංඝමිත්තා මෙහෙණින් වහන්සේ සමඟ සපිරිවරින් පැමිණි උගත්තු අප රට සංවර්ධන කේන්ද්‍රස්ථානයක් බවට පත් කළහ'

(vii). පහත දී ඇති කවි පේළි දෙකෙහි තද කළු අකුරින් දැක්වෙන ක්‍රියා වර්ගය නම් කරන්න.

(අ). පෙර විරුවන් ඔබගෙ පුතේ
ඉදි කළ වැව් **බලන්** පුතේ

(ආ). කළු වලා **කැලඹෙමින්** මුදුන් වී නැගෙනවා

(viii). ' බුද්ධි ' යන පදයට ' මත් ' ප්‍රත්‍ය එකතු කිරීමෙන් බුද්ධිමත් යන තද්ධිත පදය සෑදෙන්නාක් මෙන්,

(අ). ' මත් ' ප්‍රත්‍ය එක් කිරීමෙන් සෑදෙන වෙනත් තද්ධිත පදයක් ලියන්න.

' මිදුලෙ පහන් පැලේ නිතර
සැලුණු දැල්ල නිවී ගොස්ය '

(ආ). ඉහත කවි පදයේ ඇති කෘදන්ත පදය උපුටා දක්වන්න.

(ix). පහත වචනවල අනුක්ත රූප ලියන්න.

(අ). ගැහැණියක්  (ආ). ඔවුහු

(x). ' බීමා ' යන පදයට උඩරැටියන් ගේ ව්‍යවහාරය ද, ' වැටවල් ' යන්නට මොනරාගල ප්‍රදේශයේ ව්‍යවහාරයද ලියා දක්වන්න.

(2). පහත දැක්වෙන අ ආ ඉ ඊ විස්තර අතුරින් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වනසේ රචනයක් ලියන්න. ඒ සඳහා සුදුසු මාතෘකාවක්ද යොදන්න.

(අ). පුවත්පත නවමත් ජනතාවට තොරතුරු සපයන ප්‍රබල මුද්‍රිත මාධ්‍යයකි. පුවත්පතේ කාර්ය භාරය අතර වැදගත් වන්නේ නිවැරදි තොරතුරු කලට වේලාවට සැපයීමය. පුවත්පතින් සමාජ ආර්ථික සංස්කෘතික තොරතුරු ඉදිරිපත් කිරීමෙන් ජනතාවගේ දැනුම පෝෂණය වෙයි. වාණිජ්‍යත්වයට බරවූ ඇතැම් පුවත් පත්වල පළවන හානිකර පුවත් රටට විනාශයකි. එපමණක් නොව ප්‍රබල ලෙස චරිත ඝාතනයද සිදුවෙයි. පුවත් පතේ වගකීම සමාජ සුචරිතය සැලසීමයි.

(ආ). ' කෝප වුවත් රජ මැතිඳුන් ගත නොහෙනා
උගතමනා ශිල්පයමයි මතු රැකෙනා '

උගත්කම නිසා විනය ඇතිවන අතර විනය නිසා සමාජ වගකීම් දැරීමට සුදුස්සන් වෙතැයි පැරණි පඬි වදනකි. උගත්කමත් විනයත් ඇරඹෙන්නේ නිවසෙනි. එය පාසලේදී හා සමාජයේදී තව දුරටත් වර්ධනය වෙයි. මේ දෙකරුණ තමාගේත් සමාජයේත් දියුණුවට හේතු වන අතර විනය ගරුක වීම සංවර්ධන මිනුම් දණ්ඩක්ද වෙයි.

(ඉ). ක්‍රීඩා පිළිබඳව මුළු ලෝකයේම උනන්දුව ඉහළ ගොස් ඇති බවට ඔලිම්පික් ක්‍රීඩෝත්සවය නිදසුනකි. ශාරීරික මානසික හා සාමාජික වර්ධනය සඳහා ක්‍රීඩා කටයුතු වලින් ඉටුවන මෙහෙය නොපිළිගන්නා කෙනෙක් නැත. විශේෂයෙන්ම පාසල් වියේ සිට යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා කිපයක් පුහුණු කිරීමෙන් සමබර පෞරුෂයක්ද ඇතිවන බව පිළගත් මතයකි. විවිධ ඉසවු ඔස්සේ ක්‍රීඩා කටයුතු වර්ධනය වෙමින් පවතින මේ යුගයේ අපේ රටද, එහි කොටස්කාරයකුව් සිටීම ගැන දැක්විය හැකි උදාහරණ බොහෝය. ක්‍රීඩාවේ දී මුල්තැන දිය යුත්තේ ජයග්‍රහණයට නොව සහභාගිත්වයටය.

(ඊ). ස්වභාවික ව්‍යසනවලට මිනිසා ගොදුරු වීමට වඩාත් බලපාන හේතුව වී ඇත්තේ එවැනි දේ පිළිබඳව ඇති නොදැනුවත්කම ය. සුනාමි, නායයාම්, ගංවතුර, ළැව්ගිනි වැනි විපත් වලින් ජීවිත විශාල සංඛ්‍යාවක්ද දේපළ ද විනාශයට පත්වන්නේ මේ හේතුවෙනි. මෙවැනි විපත් සිදුවන ආකාරයත් ඒවායින් ආරක්ෂා වන ආකාරයත් පිළිබඳව පාසල් විෂය මාලාව තුළින්ම ළමයින් දැනුවත් කිරීමට පියවර ගැනීම වඩාත් කාලෝචිතය.

(3). පහත දැක්වෙන පාඨය වචන 50 - 60 අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ ඇතුළත් වචන ගණන උත්තරය අග ලියන්න.

නිවාස තැනීම හෙවත් ගෙවල් සෑදීම පිළබඳ දීර්ඝ ඉතිහාසයක් ශ්‍රී ලංකාව සතුය. එම ඉතිහාසය පිළිබිඹු කරන සාක්ෂි සොයා ගෙන තිබෙන්නේ පුරා විද්‍යාත්මක එනම් පොළොව යට කැණීම් මඟිනි. දැනට අනාවරණය වී ඇති තොරතුරුවලට අනුව ක්‍රිස්තු පූර්ව 1750 වන විට ශ්‍රී ලංකාවේ කඳුකර පළාත්වල මධ්‍ය කඳුකරයේ ජීවත් වූ ජනතාව නිවාස තනා ගැනීමේ සමත්කම් දැක්වූ බව තහවුරු වී තිබේ. ඒ කාලයට අයත් පැරණි නිවසක ගෙබිමක් සොයා ගැනීමට 2011 වසරේදී පුරාවිද්‍යාඥයෝ සමත් වූහ. එය පිහිටා තිබෙන්නේ බදුල්ල දිස්ත්‍රික්කයට අයත් හල්දුම්මුල්ලේ පිහිටි කොස්වත්ත නමින් හැඳින්වෙන පෞද්ගලික තේ වත්තකය. එහි පැරණි නිවසක ගෙබිම පිහිටා ඇත. මෙම නිවාසය සොයා ගැනීමට වසරකට පෙර තවත් පැරණි නිවාසයක ගෙබිමක් කැණීමකින් අනාවරණය විය. එය පිහිටා තිබෙන්නේ රත්නපුර දිස්ත්‍රික්කයට අයත් කුඩා ගම්මානයක් වූ උඩරංචාමඩමේය. පවුල් දහයක් පමණ ජීවත් වන මෙම ගම්මානය තිබෙන්නේ කඳු ගැටයකට අයත් සානුවකය. එනම් උස් යම බිමකය. එම නිවාසය ක්‍රිස්තු වර්ෂාරම්භයට සියවස් දොළහකට පමණ පෙර ඉදි කරන ලදැයි සැලකිය හැකිය.

(4). පහත දැක්වෙන පාඨය කියවා ඒ සමඟ අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු ලියන්න.

භාෂාව පවතින්නේ මිනිසාගේ අවශ්‍යතා පිරිමසා ගැනීම සඳහාය. ඔහුගේ ඕනෑ එපාකම්, සිතුම් පැතුම්, අදහස් උදහස් ද වෙනස් වෙයි. මේ අනුව ඔවුන්ගේ භාෂාව ද වෙනසකට පත්වෙයි . සිංහල භාෂාව උපන්නේ කවදා දැයි නිසැකවම කිව නොහැකි වුවත් එය සිදු වූයේ ක්‍රිස්තු වර්ෂයේ උදාවටත් අවුරුදු හයසියයකට පමණ ඉහත දී යැයි අනුමාන කළ හැකිය. එනම්

විජය රජතුමාගේ ලංකාගමනයෙන් පසුවය. එදා පටන් අද දක්වා සිංහලය වෙනස් වෙමින් පරිණාමයට භාජන වූ ආකාරය පැරණි සෙල් ලිපිත් සමභාවය සාහිත්‍ය ග්‍රන්ථත් විමසීමෙන් දත හැකිය. දැනට අප අතට පත් වී ඇති පැරණිම සෙල් ලිපිය හමුවන්නේ මිහින්තලේ කණ්ටක චේතිය අසල වූ ගල් ලෙනකිනි. එහි ගමණි උති මහරජ ගැන සඳහන් වී තිබේ. මෙයින් අදහස් කෙරෙන්නේ දේවානම්පියතිස්ස රජතුමාගේ සහෝදරයා වූ උත්තිය නැමැති රජතුමා බව මහාචාර්ය පරණවිතාන කියයි. ඒ අනුව මේ ලිපිය ලියා ඇත්තේ ක්‍රිස්තු වර්ෂයෙහි උදාවට අවුරුදු තුන්සියකට පමණ පෙරාතුව යැයි අනුමාන කෙරේ.

මේ සෙල් ලිපිය ලියා ඇති අකුරු වර්තමාන සිංහල වන්දනාකරුවාට කියවා ගැනීම අසීරුය. ඒ අකුරු අද සිංහල අකුරුවලට වඩා වෙනස් හෙයිනි. එදා සිංහලයා ලිවීමට ගත් අකුරු හැඳින්වූයේ බ්‍රාහ්මී අකුරු නමිනි. මේ අකුරු කලින් කලට වෙනස් වෙමින් අද සිංහල අකුරු පහළ වී තිබේ. අනාගතයෙහි දී මේ සිංහල අකුරු තව දුරටත් වෙනස් වනු ඇත.

(අ). ඉහත ලිපියට අනුව භාෂාව කෙබඳු දෙයක්ද ?

(ආ). සිංහලය වෙනස් වෙමින් පරිණාමයට භාජන වූ ආකාරය දැනගත හැක්කේ කුමකින්ද ?

(ඇ). මිහින්තලය පිළිබඳ මෙම ලිපියේ සඳහන් සුවිශේෂ සිද්ධිය කුමක්ද ?

(ඈ). පැරණි සිංහලයා ලිවීමට භාවිත කළ අකුරු හැඳින්වූයේ කිනම් නමකින්ද ?

(ඉ) . පහත සඳහන් තත්සම වචන තත්භව කොට ලියන්න

භාෂාව අක්ෂර

(5). ඔබ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා යැයි උපකල්පනය කර සිංහල භාෂා හා සාහිත්‍ය දිනය මෙවරත් උත්කර්ෂවත් ලෙස පැවැත්වීම සඳහා කටයුතු සූදානම් කරන මෙන් දන්වමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ භාෂා හා මානව ශාස්ත්‍ර අංශයේ අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයට දැනුම් දීම සඳහා මෙමෝ පතක් සකස් කරන්න.

නැතහොත් ,

කොළඹ 7, ජය මාවතේ, ' සහන' නිමැවුම් ආයතනය මඟින් නිෂ්පාදිත නවතම දන්තාලේපය වෙළඳ පොළට හඳුන්වා දී සිය සේවා ලාභීන්ගේ ආකර්ෂණය දිනා ගැනීමට අපේක්ෂා කරයි. ඒ සඳහා සුදුසු වෙළඳ දැන්වීමක් සකස් කරන්න.

ද මැසිනොද් විදුහල කඳාන

පළමු වාර පරීක්ෂණය 11 ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍ය - 111 කොටස

Learning Resource Center R The Maxwood College Kandana

කාලය පැය - 2

28 - 03 - 2016

- 1, 2, 3, 4 යන ප්‍රශ්න වලට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ.
- 5, 6, 7 යන ප්‍රශ්න වලින් එකකට උත්තර ලියන්න.

1. (i) . ගුරුළුගෝමි පඬිවරයා රචනා කළ ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

   (ii) . අඟුල්මල් දමනය රචනා කිරීම සඳහා කතුවරයා මුල් කොට ගත් බුදුගුණය කුමක්ද?

2. (i) . සතරකන් මන්ත්‍රණය පාඨම උපුටාගෙන ඇති මුල් ග්‍රන්ථයේ නම කුමක්ද ?

   (ii) . එම ග්‍රන්ථය රචනා කිරීමට අනුග්‍රහය දැක්වූ ඇමති වරයාගේ නම ලියන්න.

3 . " මහරජ නොබව මාගේ ගෙයි කුමරෙක් උපන".

   (i) . මෙසේ කී තැනැත්තාගේ නම ලියන්න.

   (ii) . මෙම සිදුවීම ඇතුළත් කතාවේ මුල් ග්‍රන්ථයේ පළමු පරිච්ඡේද තුන නම් කරන්න.

4. (i) . සද්ධර්මරත්නාවලිය රචනා කළේ කවුද ?

   (ii) . සද්ධර්මරත්නාවලියට මූලාශ්‍ර වූ කෘතිය නම් කරන්න.

5. දිය දිය ගොය පළ කෙරෙමින් සපැමිණි
   ගිය ගිය තැන ඉස්වා රන් මුතුමිණි

   (i) . කවියේ ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න.

   (ii) . ගුත්තිල කාව්‍යයේ රචකයා නම් කරන්න.

6. " මා ගිය කලැ ඔහුට සෙත් වෙයි ගම් නැති තැනැ මහ වල්හි සිටියෙ සිවුපදගයක් අසා මා කෙරෙහි පැවිජි වැ රාත් වෙයි

   (i) . අඞ්ගුලිමාල හැර බුදුන්වහන්සේ දමනය කළ වෙනත් පුරුෂයින් දෙදෙනෙකු නම්කරන්න.

   (ii) . අඞ්ගුලිමාල හට ලැබුණු පැවිද්ද නම් කරන්න.

7. (i) . සිංහල ජන ජීවිතය ගැන ඉංග්‍රීසි ලේඛකයෙකු විසින් රචනා කරන ලද සුවිශේෂ නවකතා ව හා එහි රචකයා නම් කරන්න.

   (ii) . ඔබා මුතු , නන්දන ගීත යන කාව්‍ය කෘතීන් හි රචකයා නම් කරන්න.

8. රන්තරු පිරිවරා ගත් සඳ මඬල යට
   මහවන බිමක් මැද ගිරි කුළු අතර සිට

   (i) . කවියේ ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න.

   (ii) . එච් එම් කුඩලිගම කවියාගේ වෙනත් පද්‍ය ග්‍රන්ථ 2 ක් නම් කරන්න.

9. (i) . සිංහබාහු නාට්‍ය නිර්මාණය කළේ කවුද ?

   (ii) . එතුමා ගේ ස්වයං චරිතාපදානය නම් කරන්න.

10. (i) . උග්ගසේන නම් සිටු පුත්හුගේ වස්තුවෙන් ලබා දෙන පණිවිඩය කුමක්ද ?

    (ii) . සද්ධර්මරත්නාවලිය කිනම් යුගයකට අයත් කෘතියක්ද ?

( 2 ). පහත දී ඇති ගද්‍ය පද්‍ය පාඨවල කළු අකුරින් ඇති කොටස්වල අර්ථය වෙනම දක්වා මුළු කොටසේම අර්ථය ලිහිල් බසින් ලියන්න.

1. ඔහට සඞ්ග්‍රහ කළ මැනවැ 'යි පෙරවරු **සුගත් මහපහුල්** හැදැ පෙරෙවැ නුවර වැදැ වළඳා වෙහෙර ගොස් ඔව්හට සඞ්ග්‍රහ කටැටි වැ දෙව්රමින් නික්මැ **අධන්මඟ** පිළිපන්හු.

2.
**පන් සිළු** වීණා නද පයු බැස්වූ
මන් පිනවන වෙණා නද යෙන් තොස්වූ
නන් දන කැන් දුටුවද බිය සිස්වූ
**මින් රළ** වුත් ගං වෙරළට රැස්වූ

3. **නටක විද්දතු** පන් සියයෙක් හවුරුද්දෙන් සමඟින් රජගහ නුවරට අවුදින් රජ්ජුරුවන්ට සතියක් මුළුල්ලෙහි **කෙළි පැ** බොහෝ රත්රන් ලැබෙති.

4 .
තුමුල ගතින් දා
බාහු බෙලෙන් දා
වෙමි සේ **තිදසින් දා**
කුරිරු ගිජින් දා
කුඹු තල සින් දා
ලමි සේ **කෙසරින් දා**

- 3 සහ 4 ප්‍රශ්නවලින් එක බැගින් තෝරාගෙන ප්‍රශ්න දෙකකට පිළිතුරු ලියන්න. සෑම පිළිතුරකම වචන 150 - 200 අතර ප්‍රමාණයක් තිබිය යුතුය.

( 3 ) " අමාවතුර රසවත් නිර්මාණයක් බවට පත්ව ඇත්තේ එහි භාවිත භාෂා ශෛලිය නිසාය "

මෙම කියමන පහත කරුණු සඳහා උදාහරණ දෙක බැගින් දක්වමින් සාකච්ඡා කරන්න.

i. කෙටි වැකි භාවිතය
ii. ප්‍රකෘති කථන යෙදුම්

නැතහොත්,

" බැද්දේගම නවකතාව සාර්ථක වී ඇත්තේ අහිංසක ගැමි චරිත යථාර්ථවාදී ලෙස නිරූපණය කර තිබීම නිසාය "

i. පුංචි මැණිකා
ii. කර්ලිනාහාමි යන චරිත ඇසුරින් සාකච්ඡා කරන්න.

( 4 ) සිංහබාහු නාට්‍යයේදී අපට හමුවන්නේ ,

i. දරුවන්ගේ සුබ සිද්ධිය තකා ක්‍රියා කරන ආදර මාතාවක් හා
ii. තරුණ හැඟීම් හා ක්‍රියාකාරිත්වයෙන් ඔද වැඩුණු පුත්‍රයෙකි .

එක් කරුණකට නාට්‍ය පෙළෙන් උදාහරණ දෙක බැගින් දෙමින් ඉහත කරුණ පැහැදිලි කරන්න.

නැතහොත් ,

ගංගාවේ සංගීතය රසවත් නිර්මාණයක් වී ඇත්තේ ,

i. කවියා ගැඹුරු ජීවන දර්ශනයක් ඉන් ගෙන හැර පෑමත්
ii. අජීවී පරිසරයට සජීවී බවක් එක් කිරීමත් නිසාය.

එක් කරුණකට පද්‍ය පන්තියෙන් උදාහරණ දෙක බැගින් දෙමින් ඉහත කරුණ පැහැදිලි කරන්න.

- 5, 6, 7 ප්‍රශ්න වලින් එකකට පිළිතුරු සපයන්න. ඔබේ පිළිතුරේ වචන 150 - 200 අතර ප්‍රමාණයක් තිබිය යුතුය.

5. සංකල්ප රූප මැවෙන අයුරින් අවස්ථා සිද්ධි නිරූපණයට අමාවතුර කතුවරයා දක්වන දක්ෂතාවය උදාහරණ 4 ක් ගෙන පැහැදිලි කරන්න.

6. " උග්ගසේන සිටු පුත්‍රයා ජීවිතයේ අභියෝග ජයගත් තරුණයෙකි " උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව ඇසුරෙන් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

7. යහපත් දිවි පෙවෙතක් ගත කිරීමට අවශ්‍ය උපදෙස් දෙන්නට ජනකවියා තුළ වූ හැකියාවනියමිත පද්‍ය පන්ති වලින් උදාහරණ 4 ක් දෙමින් පැහැදිලි කරන්න.